ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය
කොළඹ

**පුවත්පත් නිවේදනය**

<u>ඉන්දියාවේ අපනයන සංවිධාන සම්මේලනය සහ ශ්‍රී ලංකාවේ අපනයනකරුවන්ගේ ජාතික මණ්ඩලය අතර සහයෝගීතාවය සඳහා අවබෝධතා ගිවිසුමක් අත්සන් තැබේ</u>

කොළඹ, ඉන්දිය මහ කොමසාරිස් කාර්යාලය විශේෂයෙන්ම ක්ෂුද්‍ර, කුඩා සහ මධ්‍යම පරිමාණ ව්‍යවසාය අංශය සඳහා සහයෝගය ලබා දීමේ අරමුණින් ද්විපාර්ශ්වික ආර්ථික හවුල්කාරිත්වයන් ප්‍රවර්ධනය කිරීම සහ සහයෝගීතාවය සඳහා නව ක්ෂේත්‍ර හඳුනා ගැනීම සඳහා ඉන්දියාවේ සහ ශ්‍රී ලංකාවේ විවිධ සංවිධාන අතර සාකච්ඡාවන්ට පහසුකම් සලසයි. ඉන්දියාවේ අපනයන සංවිධාන සම්මේලනය (FIEO) සහ ශ්‍රී ලංකාවේ අපනයනකරුවන්ගේ ජාතික මණ්ඩලය (NCE) අතර එවැනි සාකච්ඡාවක් 2025 ජූනි මාසයේදී පවත්වන ලදි.

2. 2025 අගෝස්තු 19 වන දින ඉන්දියාවේ අපනයන සංවිධාන සම්මේලනය සහ ශ්‍රී ලංකාවේ අපනයනකරුවන්ගේ ජාතික මණ්ඩලය විසින් තොරතුරු බෙදා හදා ගැනීම, ආයෝජන සහ වෙළෙඳ කටයුතු යනාදිය සඳහා හවුල්කරුවන් සම්බන්ධ කිරීම ඇතුළු සහයෝගීතාවය සඳහා නව අවස්ථා ගවේෂණය කිරීමේ අරමුණිනින් අවබෝධතා ගිවිසුමක් අත්සන් තබන ලදි.

3. අතථ්‍ය ආකාරයෙන් පැවති මෙම අවස්ථාව සඳහා ඉන්දියාවේ අපනයන සංවිධාන සම්මේලනයේ අධ්‍යක්ෂ ජනෙරාල් සහ ප්‍රධාන විධායක නිලධාරී ආචාර්ය අජේ සහායි මහතා ප්‍රමුඛ එහි නියෝජිතයන්, ශ්‍රී ලංකාවේ අපනයනකරුවන්ගේ ජාතික මණ්ඩලයේ සභාපති ඉන්ද්‍ර කෞෂාල් රාජපක්ෂ මහතා ප්‍රමුඛ එහි නියෝජිතයන් මෙන්ම කොළඹ ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලයේ නියෝජිතයන් ද සහභාගී වූහ.

****

**කොළඹ**

***2925* අගෝස්තු *19***